# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

## 2021 දෙසැම්බර් මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක ඉහළ යන ලදී.

**නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම්හි වර්ධනය තව දුරටත් පවත්වා ගැනීම පිළිබිඹු කරමින් නිෂ්පාදන අංශයෙහි ගැණුම් කළමණාකරුවන්ගේ දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව 2021 දෙසැම්බර් මාසයේ දී 58.1ක අගයක් වාර්තා කරමින් ඉහළ යන ලදී.** මේ සඳහා නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වූ අතර සේවා නියුක්තිය උප දර්ශකය හැර අනෙක් සියලුම උප දර්ශකයන්ගේද වර්ධනයන් වාර්තා විය.

නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශකයන් හි වර්ධනය කෙරෙහි උත්සව සමය හේතුවෙන් ආහාර හා පාන අංශයේ ඇති වූ ඉල්ලුම හේතු විය. රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයෙහි ද නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශකයන් සුළු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුව ද, සේවා නියුක්තිය උප දර්ශකය නොවැම්බර් මාසයට සාපේක්ෂව 2021 දෙසැම්බර් මාසයේ දී පහත වැටුණි. නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක වලට සාපේක්ෂව තොග මිලදී ගැණුම් උප දර්ශකය අඩු වේගයකින් වර්ධනය විය. බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළ පරිදි එළඹෙන චීන අලුත් අවුරුදු නිවාඩුවට පෙර තොග සැලකිය යුතු ලෙස එක් රැස් කිරීමට අවශ්‍යතාවයක් පැවතිය ද ආනයන ආශ්‍රිත ගැටලු හේතුවෙන් එය සිදු කළ හැකි වූයේ යම් ප්‍රමාණයකට පමණි.

| විචලයය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **61.9** | **58.1** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 67.2 | 65.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 64.0 | 58.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.7 | 48.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 64.0 | 52.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 58.6 | 61.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2021 දෙසැම්බර් මාසයේ දී වැඩි වේගයකින් ඉහළ යන ලදී. මේ සඳහා වරායන් ආශ්‍රිතව පැවති තදබදයන් හේතුවෙන් වූ ප්‍රමාදයන්, චීන අලුත් අවුරුදු නිවාඩුවට පෙර ඇණවුම් ඉහළ යෑම සහ, දේශීය අමුද්‍රව්‍ය හිඟ වීම මූලික වශයෙන් හේතු විය.


රට තුළ මෙන්ම ගෝලීය ආර්ථික කටයුතු තව දුරටත් වර්ධනය වීමක් අපේක්ෂා කරමින් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් ඉහළ මට්ටමක පවතී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**58.1**

**2021 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 3.8ක පහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ඉහළ යාම 2021 වසර අවසන් වන විටද පවත්වාගනිමින් ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 දෙසැම්බර් මාසයේ දී 54.2ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

2021 නොවැම්බර් මාසයේ දී පහළ යන ලද චීනයෙහි නිෂ්පාදන අංශයෙහි ගැණුම් කළමණාකරුවන්ගේ දර්ශකය දෙසැම්බර් මාසයේ දී සුළු වශයෙන් වර්ධනය විය. මේ අතර, 2021 දෙසැම්බර් මාසයේ දී සිංගප්පූරුවෙහි ගැණුම් කළමණාකරුවන්ගේ දර්ශකයද ඉහළ යන ලදී. එසේ වුව ද, එක්සත් ජනපදය, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, ඉන්දියාව සහ රුසියාවේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශක පෙර මාසයට සාපේක්ෂව 2021 දෙසැම්බර් මාසයේ දී අඩු විය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2022 ජනවාරි 18 වන දිනට*

---

[1] *මාකිට් යනු ලොව ප්‍රධාන පෙලේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**2021 වසර සඳහා ශක්තිමත් අවසානයක් සනිටුහන් කරමින් සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, දෙසැම්බර් මාසයේ දී 62.4ක දර්ශක අගයක් දක්වා ඉහළ ගියේය.** මෙම ඉහළ යෑම සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල ඉහළ යෑම් හේතු විය.

බොහෝ උප අංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමඟ නව ව්‍යාපාර නොවැම්බර් මාසයට සාපේක්ෂව දෙසැම්බර් මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය.

ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම මෙන්ම උත්සව සමය ඉල්ලුමේ අඛණ්ඩ වර්ධනයට හේතු වූ අතර, ඊට සමගාමීව සේවා අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දෙසැම්බර් මාසයේ දී ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කළේය. ඒ අනුව, සියලුම උප අංශවල පාහේ ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනයන් පෙන්නුම් කළ අතර, මූල්‍ය සේවා, ප්‍රවාහන, තොග හා සිල්ලර වෙළඳාම සහ අනෙකුත් පෞද්ගලික සේවා යන උප අංශවල විශාල වර්ධනයන් දක්නට ලැබුණි. මේ අතර, උත්සව සමය සහ විදේශීය සංචාරකයන්ගේ පැමිණීම්වල සැලකිය යුතු වර්ධනය මධ්‍යයේ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උප අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් ද සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

ව්‍යාපාර ක්‍රියාකාරකම්වල පවතින ධනාත්මක වර්ධනයන් හේතුවෙන් සමාගම් විසින් ඔවුන්ගේ කාර්ය මණ්ඩල අඛණ්ඩව පුළුල් කිරීම නිසා දෙසැම්බර් මාසයේ දී සේවා නියුක්තිය තවදුරටත් ඉහළ ගියේය. මේ අතර, කාර්ය මණ්ඩල සේවකයන් සාමාන්‍ය පරිදි සේවයට වාර්තා කිරීම හේතුවෙන් දෙසැම්බර් මාසයේ දී නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව පහළ ගියේය.

| විචල්‍යය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **62.1** | **62.4** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 65.7 | 67.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 71.7 | 72.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.0 | 53.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 47.3 | 45.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 74.0 | 72.8 | + | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ලිහිල් කරන ලද කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත සීමා ඉදිරියටත් පවතිනු ඇතැයි බලාපොරොත්තුවෙන් ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් දෙසැම්බර් මාසයේ දී තවදුරටත් වර්ධනය විය. එසේ වුවද, සමහර ප්‍රතිචාර දක්වන්නන් විසින් සැපයුම් කෙරෙහි ඇති බාධා සහ COVID-19 නව ප්‍රභේදවල බලපෑමෙන් පැන නැගිය හැකි උද්ධමන පීඩන නිසා ඇති විය හැකි අභියෝගාත්මක ආර්ථික තත්ත්වය හේතුවෙන් ව්‍යාපාරික පරිසරය තවදුරටත් අවිනිශ්චිත විය හැකි බව සඳහන් කරන ලදී.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**62.4**

**2021 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.3ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි සාපේක්ෂව අඩු වර්ධනයක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 නොවැම්බර් මාසයේ පැවති 55.6 සිට 2021 දෙසැම්බර් මාසයේ දී 54.6 දක්වා පහත වැටුණි.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව, ජපානය සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 දෙසැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2022 ජනවාරි 13 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.